# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,823 — 1961 දෙසැම්බර් 13 වැනි බදාදා — 13.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**1961 අංක ඇෆ්පීසිඇම්/44 දරණ මිළ නියෝගය** — **දුඹුරු සහ සුදු සීනි**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

**නියෝගය**

පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් වෙල්ලයියා නිට්කුනානන්දන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) අංක 12,569 සහ 1961 අගෝස්තු මස 3 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක ඇෆ්පීසී ඇම්/34 දරණ මගේ මිළ නියෝගය අද දින සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මෙයට යාකර ඇති උපලේඛනයේ පිළිවෙළින් සඳහන් දුඹුරු සීනි සහ සුදු සීනි තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක්ද, සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, පහත සඳහන් උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් පෙදෙස්වල විකිණිය හැකි වැඩිම මිළ ගණන් එකී උපලේඛනයේ 2 සහ 4, 3 සහ 5 වෙනි තීරයන්හි අනුපිළිවෙළින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්යය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සීනි දළබර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණයක් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම සීනි ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ඇ) ''සීනි'' කීවිට සියළුම වර්ගවලට අයත් හකුරු අතහැර සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, සීනි වෙන ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බවද මෙයින් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ සිය සවාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ සීනි තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම එම ප්‍රදේශය සඳහා මෙම නියෝගයෙන් නියමිත සීනිවල වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එම ස්ථානයේ හෝ වාහනයේ හෝ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවද නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, තොග වශයෙන් සීනි විකුණන සෑම තැනැත්තෙකුම හා සිල්ලර වශයෙන් සීනි විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත්, මතු සඳහන් එනම්:—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සීනි වර්ග සහ ප්‍රමාණය බර අනුව ;

(ඇ) විකුණූ සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම්, වෙළෙඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද, යන විස්තර ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්‍යය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) සීනි විකුණන විට එය යම් කිසි දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් යම් කිසිදෙයක බහා ලනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 2 සහ 4, 3 සහ 5 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත්වන බවද නියම කරමි.

1961 දෙසැම්බර් මස 4 වෙනි දින පෙ. ව. 9 ට පුත්තලම දිසාපති කාර්‍යාලයේදී අත්සන් තබන ලදී.

සී. නිට්කුනානන්දන්,
පුත්තලම පාලන දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

2327—ජේ. ඇන්. ආර්. 369—5,425 (12/61)

## I වෙනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | දුඹුරු සීනි<br>2 වෙනි තීරය<br>දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | දුඹුරු සීනි<br>3 වෙනි තීරය<br>ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>ශ. | සුදු සීනි<br>4 වෙනි තීරය<br>දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | සුදු සීනි<br>5 වෙනි තීරය<br>ශුද්ධබර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ<br>ශ. |
|---|---|---|---|---|
| 1. දකුණු පිටිගල් කෝරලේ ප්‍රාදේශිය ආදයම් නිළධාරිතැනගේ සියළුම ප්‍රදේශ ... | 58 85 ... | 55 ... | 66 14 ... | 62 |
| 2. උඩප්පුව බත්තුළුඹය, පුලිච්චාකුලම, මාදම්පෙ හැර උතුරු පිටිගල් කෝරලේ ප්‍රාදේශිය ආදයම් නිළධාරි තැනගේ සියළුම ප්‍රදේශ | 59 20 ... | 55 ... | 67 00 ... | 62 |
| 3. මාදම්පෙ සහ නගර සභාවේ ප්‍රදේශ ... ... ... | 59 20 ... | 55 ... | 66 74 ... | 62 |
| 4. පුත්තලම උප නගර සභාවේ ප්‍රදේශය සහ උතුරු පිටිගල් කෝරලේ ප්‍රාදේශිය ආදයම් නිළධාරිතැනගේ කොට්ඨාශයට අයිති උඩප්පුව බත්තුළුඹය සහ පුලිච්චාකුලම | 59 78 ... | 56 ... | 67 28 ... | 65 |
| 5. පුත්තලම උප නගර ප්‍රදේශය හැර පුත්තලම් පත්තු සහ කඩවත්හි ප්‍රාදේශිය ආදයම් නිළධාරි තැනගේ සියළුම ප්‍රදේශ | 59 78 ... | 56 ... | 67 50 ... | 65 |
| 6. ඊතාලේ සහ ආණමඩුව ... ... ... | 60 03 ... | 56 ... | 67 53 ... | 65 |
| 7. ඊතාලේ හැර කල්පිටිය ප්‍රාදේශීය ආදයම් නිළධාරි තැනගේ සියළුම ප්‍රදේශ සහ ආණමඩුව හැර දෙමළ හත් පත්තුව ප්‍රාදේශීය ආදයම් නිළධාරි තැනගේ සියළුම ප්‍රදේශ | 60 18 ... | 58 ... | 67 68 ... | 65 |

**සැලකිය යුතුයි.**—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියම මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන්වලට ඉහළින් එම ද්‍රව්‍ය විකිණිය නො හැකිය.

12–946

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රනය කරන ලදී.